## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

## ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

## ව්‍යාපෘති අංකය : P166865

## ණය අංකය : - 6619-LK

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ලෝක බැංකුව) වෙත ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ (IWWRMP) පිරිවැය අරභයා ණය මුදලක් සඳහා අයදුම්කර ඇති අතර, එම ණය මුදලේ ලැබීම්වලින් කොටසක් පහත උපලේඛනයේ සඳහන් කොන්ත්‍රාත්තු යටතේ වන ගෙවීම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.
2. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනතාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙනුවෙන් IWWRM ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් වගුව 01 හි සඳහන් පරිදි පහත සඳහන් කර්මාන්ත සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

**වගුව 01**

| අංකය | කොන්ත්‍රාත් අංකය | වැඩ විස්තරය | පළපුරුද්ද/CIDA ලියාපදිංචිය | ලංසු ඇපකරය හා වලංගු කාලය | නැවත නොගෙවන ලංසු ලිපි ලේඛන ගාස්තුව | ඉදිකිරීම් කර්මාන්තයේ වාර්ෂික ධාරිතාවයේ සාමාන්‍යය හා ද්‍රවශීල වත්කම් හා/ හෝ ණය පහසුකම්වල අවමය (රු.) |
|---|---|---|---|---|---|---|
| 1 | LK-MOMDE-433771-CW-RFB | මල්ලාවි වැව පුනරුත්ථාපනය (කොන්ත්‍රාත් කාලය දින 365) | **ශ්‍රේණිය :** C4 හෝ ඉහළ<br>**විශේෂත්වය :** වාරිමාර්ග සහ ජලාපවහන ඇළ මාර්ග | **ලංසු සුරක්ෂණ මුදල :** රු. 1,400,000.00<br>**වලංගුතාවය :** 2026.01.23 දක්වා (දින 147) | 22,000.00 | මිලියන 166.80 සහ මිලියන 27.80 |

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ලංසු ලිපිලේඛනයේ සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය. තවද ලංසුකරු සතුව ඉහත වගුවේ සඳහන් ආකාරයට, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) වාරිමාර්ග සහ ජලාපවහන ඇළ මාර්ග විශේෂත්වය යටතේ අදාළ ශ්‍රේණිය සඳහා වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය.
4. ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීම සඳහා **https://www.iwwrmp.lk/ web/procurement/section/procurement-notices** යන වෙබ් අඩවියේ පළ කර ඇත.
5. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ අංක 96 පිහිටි මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ල, 2 වන මහලේ IWWRM ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති විශේෂඥ (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්) වෙතින් ලබාගත හැකි අතර, පෙර දැනුම් දීමක් මගින් 2025.07.31 වෙනි දින සිට 2025.08.28 වෙනි දින දක්වා රාජකාරී දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අතරතුර කාලයේදී ඉහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය. (දුරකථන අංකය: 0112691163)
6. අපේක්ෂිත ලංසුකරුවන්ට, ඉහත සඳහන් ලංසු ලිපිලේඛන කට්ටලයක් සඳහා වන නැවත නොගෙවන ලංසු ලිපිලේඛන ගාස්තුව (මුදල සඳහා වගුව 01 බලන්න) මුදලින් ගෙවීමෙන් අනතුරුව පූර්ව දැනුම් දීමකින් පසු (දුරකථන අංක : 011-2691163) 2025.07.31 වෙනි දින සිට 2025.08.28 දින දක්වා වැඩකරන දිනයන්හි 09.30 පැය සිට 15.00 පැය අතර, කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ අංක 96 හි මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ලේ 2 වන මහලේ IWWRM ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත සමාගමේ/ ආයතනයේ ලිපි ශීර්ෂයක ලියන ලද ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හෝ ලංකා බැංකුවේ හයිඩ් පාක් ශාඛාවේ ඒකාබද්ධ ජලාධාර හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය නමින් පවත්වාගෙන යනු ලබන අංක 7042633 දරන ගිණුමට එකී නැවත නොගෙවන ලංසු ලිපිලේඛන ගාස්තුව බැර කර ලබාගත් බැංකු තැන්පතු පත්‍රිකාවේ ස්කෑන් කරන ලද පිටපතක් ලංසු ලිපිලේඛන ඉල්ලා ලිඛිත ඉල්ලීම් ලිපියක් සමග **iwwrmp@sltnet.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවීමෙන් ලංසු ලිපිලේඛන ලබාගත හැකිය.
7. පූර්ව ලංසු රැස්වීමක් හා වැඩ බිම් සංචාරයක් පහත වගුව 2 හි සඳහන් පරිදි පවත්වනු ලැබේ. අදාළ නිලධාරීගේ සහාය ඇතිව වැඩ බිම පරීක්ෂා කර බලන මෙන් ලංසුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**වගුව 02**

| අංකය | කොන්ත්‍රාත් අංකය | වැඩ බිම් පරීක්ෂාව | පූර්ව ලංසු රැස්වීම | ලංසු අවසන් කිරීමේ හා විවෘත කිරීමේ දිනය හා වේලාව |
|---|---|---|---|---|
| 01 | LK-MOMDE -433771-CW-RFB | **දිනය :** 2025/08/12<br>**වේලාව :** පෙ.ව. 10.00<br>**ස්ථානය :** වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය, වවුනිකුලම්, මුලතිව්. | **දිනය :** 2025/08/14<br>**වේලාව :** පෙ.ව. 11.00 සම්මන්ත්‍රණ කාමරය, IWWRMP, 2 වන මහල, මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ල, අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07. | **දිනය :** 2025/08/29<br>**වේලාව :** ප.ව. 2.00 |

8. ලංසු ලිපිලේඛනයේ සියලුම පිටු ලංසුකරු විසින් අත්සන් කර ඔහුගේ මුද්‍රාව තබා තිබිය යුතුය.
9. සම්පූර්ණ කරන ලද ලංසු, පිටපත් දෙකකින් යුතුව, බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම හා අංකය පැහැදිලිව සඳහන් කර වගුව 02 හි සඳහන් පරිදි ව්‍යාපෘති අධ්‍යක්ෂ, IWWRM ව්‍යාපෘතිය, 2 වන මහල, මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ල, අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07 වෙත ලියාපදිංචි තැපැල් මගින් අතින් ගෙනවිත් භාරදීමෙන් හෝ සීඝ්‍රකුත සේවාව මගින් යොමු කළ යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණ සිටීමට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ දෙදෙනෙකුට (2) නොවැඩි බලයලත් නියෝජිතයන්ට අවසර දෙනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ, ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය,**
**2 වන මහල, මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ල,**
**අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.**

**2025.07.28**